#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/34 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/05/2016/145.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. ඩබ්. නන්දසිරි මයා., ''ශ්‍රී කාන්ති'', 5 කණුව, උඩුවර, හාලිඇල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, නො. 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/05/2016/145.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත
(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. ඩබ්. නන්දසිරි මයා., ''ශ්‍රී කාන්ති'', 5 කණුව, උඩුවර, හාලිඇල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''2013.01.15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 අනුව 2013.01.01 දින සිට රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කර තිබියදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කළ ජී. ඩබ්. නන්දසිරි මහතාව වයස අවුරුදු 57 මාස 6 ක් තිබියදී අනිවාර්ය විශ්‍රාම ගැන්වීමත් නැවත 2015.05.07 දින වැටුප් රහිතව සේවයේ පිහිටුවීමත් මගින් ඒ මහතාට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 – 582

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.